ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 - 11 - 29

| | | | |
|---|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | | ටී.ජ්.ආනන්ද රාජකරුණා මයා.<br>අංක සී/28,<br>උඩපිටිය,<br>යටියන්තොට. |
| වගඋත්තරකාර පාර්ශවය | : | 01. | නාවික හමුදාපති,<br>නාවික හමුදා මූලස්ථානය,<br>කොළඹ 01. |
| | | 02. | ආඥාපති,<br>ස්වෙච්ඡා නාවික හමුදා මූලස්ථානය,<br>වැලිසර,<br>රාගම. |
| | | 03. | කොමදෝරු අයි.ආර්.ප්‍රේමරත්න මයා.<br>නාවික හමුදා මූලස්ථානය,<br>කොළඹ 01. |

<u>පැමිණිලි අංකය : එච්.ආර්.සී/2953/16</u>

**පැමිණිල්ලෙන් දක්වා ඇති කරුණු :**

පැමිණිලිකරු ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්වෙච්ඡා සේවයේ නිල අංක : AS 56011 යටතේ නාවිකයෙකු ලෙස 1999.09.30 දින සිට සේවය කරන ලද අයෙකු බව දක්වා ඇත. ප්‍රශ්නගත සිදුවීම 2016 වනතුරු ඔහුට විරුද්ධව කිසිදු නීති විරෝධී හෝ විනය විරෝධී ක්‍රියාවක් සම්බන්ධව චෝදනාවක් තිබී නැති බවද තම



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

උපරිම අවංක සේවය නාවික හමුදාවට ලබාදුන් බවද තම පැමිණිල්ලෙන් හා ඊට අමුණා ඇති දිවුරුම් ප්‍රකාශයෙන් දක්වා තිබේ.

2016.07.07 දින සංඥාවක් මගින් නාවික හමුදාවට ලබාදුන් පණිවුඩය මගින් තමා සේවයෙන් ඉවත් කර තිබූ බව ද 2016.07.21 දිනට පෙර සියලූ නිල ඇදුම් භාර දී ඉවත් වන ලෙස 02 වන වගඋත්තරකාර ස්වෙච්ජා නාවික හමුදා මූලස්ථානය මගින් දන්වා තිබූ බවය. එහෙත් එසේ සේවයෙන් ඉවත් කිරීමට හේතුවක් තමාට දන්වා නොතිබූ බවද ප්‍රකාශ කර සිටී. එහෙත් තමා දන්නා තරමින් යම් සිදුවීමක් මෙයට හේතු වී ඇති බවට තමා සැක පහල කරන බවද දිවුරුම් ප්‍රකාශයෙන් දක්වා ඇත. එම සිදුවීම වන්නේ නාවික හමුදාවේ අකුරේගොඩ සේවා ස්ථානයේ කටයුතු කරන විට 2014.09.21 දින තමා සමග සේවය කරන නාවිකයෙකු වන එච්.එම්.ඩී.එම්.හේරත් යන අය තම නිවසට පැමිණි අවස්ථාවක තම නිවසේ කාමරයක තිබූ රු.13,800/-ක් සහ බැංකු පොතක් සොරකම් කල බවට තම බිරිද දුටු පසු සැක සිතී එය විමසූ පසු ඔහු එය නොගත් බව ප්‍රකාශ කළද පසුව එම වරද තහවුරු වී තිබූ බව ය. පසුව එම සොරකම් කල මුදල ලබාදීමට එකග වූ බවද බැංකු පොත කැලයකට විසිකර තිබූ බව ඔහු කියා සිටි බවද මේ පිළිබඳ නාවික හමුදාවට නොදන්වන ලෙස ද බැගෑපත් වූ බවය. සොරකම පිළිගෙන කොටස් වශයෙන් එය ගෙවීමට එකගව පළමුව රුපියල් 5,500/-ක් ගෙවා ඉතිරි මුදල ගෙවීමට නියමිතව තිබියදී පැමිණිලිකාර තමා ඔහුගෙන් බලහත්කාරයෙන් මුදල් ලබාගත් බවට කඳවුරේ අංශභාර නිලධාරී වන ලූතිනන් ඩබ්.ජ්.වික්‍රමරත්න (දැනට විශ්‍රාමික) හට පැමිණිලිකර තිබී ඇත. තමාගෙන් සොරාගත් මුදල් ඔහු විසින්ම වරද පිළිගෙන තලවතුගොඩ එච්.එන්.බී. බැංකුවේ (HNB) ATM යන්ත්‍රයෙන් ලබා දී තිබියදී පැමිණිලිකාර තමා මෙම සිදුවීම නාවික හමුදාවේ ඉහළ නිලධාරීන්ට පැමිණිලි නොකිරීමේ සද්භාවීය ක්‍රියාවම තමාට එරෙහිව සිදු වෙමින් සොරකම් කල අය විසින් ව්‍යාජ පැමිණිල්ලක් කර තමා ඔහුගෙන් බලෙන් මුදල් ලබාගත් බවට නාවික හමුදා නිලධාරීන්ට දන්වා තිබී ඇත.

පසුව නාවික හමුදාවේ අකුරේගොඩ ආයතනයේ අණදෙන නිලධාරි විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත් කර පරීක්ෂණ වාර්තාවක් ලබා එහි අඩංගු කරුණු කිසිත් තමාට නොපෙන්වා කියවීමටද ඉඩ නොදී තම අත්සන බලහත්කාරයෙන් ගත් බවද ප්‍රකාශ කර සිටී.

මෙහිදී ලූතිනන් ඩබ්.ජ්. වික්‍රමරත්න යන අය " තමන්ගේ වල තමන්ම කපාගත් " බව කියා සිටි බවද දිවුරුම් ප්‍රකාශයෙන් දක්වා තිබේ.

එමෙන්ම කඳවුරේ විධායක නිලධාරි ලෙස සිටි ලූතිනන් කමාන්ඩර් කේ.ආර්.එම්.රත්නායක විසින් නැවත එම මුදල හේරත් යන අයට ගෙවන ලෙස බල කල ද තමාගෙන් සොරකම් කල මුදල නැවත හේරත්ට දීමට නොහැකි බව. පවසා සිටීම මත නාවික හමුදාවේ මෙම නම් කල නිලධාරීන් තමාට එරෙහිව ද්වේශ සහගතව කටයුතු කල බවද දක්වා තිබේ. ඒ අනුව කපිතාන් අයි.ආර්.ප්‍රේමරත්න යන අය විසින් " නොදෙන සල්ලි ගන්න හැටි බලාගනින්" ලෙස පැවසූ බවද "නාවික හමුදාවෙන් ඉවත් කරන " බව ද "මා සමග හැප්පෙන්නට ආ කිසිවෙකු හට නාවික හමුදාවේ ඉන්න නොදෙන" බවද "හැප්පෙන්නට ආවේ නරක මිනිසෙකු සමග" බවද යන තර්ජනාත්මක ප්‍රකාශ සිදු කර කපිතාන් අයි.ආර්.ප්‍රේමරත්න විසින් සිදු කළ බව දිවුරුම් ප්‍රකාශයෙන් දිවුරා ප්‍රකාශ කර තිබේ.

ඒක පාර්ශ්වීයව සිදු කල බැවින් අභියාචනයක් හෝ සිදුකිරීමට කඳවුරේ අණදෙන නිලධාරී විසින් ඉඩ ලබා නොදුන් බවද නාවික හමුදාපති හා අතිගරු ජනාධිපතිතුමා දක්වා කල අභියාචනා සළකා බලා පියවරක් නොගත් බැවින් නීති විරෝධී හා විනය විරෝධී ක්‍රියාවක් නොකළ තමාගේ සේවා කාලය වසර 18ක් පමණ තිබීමද නොසළකා හරිමින් අවසන් කර තිබීම පිළිබඳ අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කර තම මූලික අයිතිවාසිකම් කඩ කර තිබීම පිළිබඳ නිර්දේශයක් සමග 2016.07.07 දින සිට නැවත සේවයේ පිහිටුවා තමාට එරෙහිව කටයුතු කළ නිලධාරින්ට එරෙහිව ක්‍රියා කරන ලෙස නාවික හමුදාපති මගින් ක්‍රියා කරවීමට කටයුතු කර හිමිවියයුතු වරප්‍රසාද සමග සහන ලබාදෙන ලෙසයි.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :

නාවික හමුදාපති වෙනුවෙන් දක්වා ඇත්තේ පැමිණිලිකරු විසින් නාවිකයකු වන එච්.එම්.ඩී.එම්.හේරත් යන අයෙකුගෙන් බලහත්කාරයෙන් මුදල් ලබා ගනිමින් එම සොරකම් කළ මුදල් නැවත ලබා ගැනීමක් බවට පැමිණිලිකරු ප්‍රකාශ කරන බවය. එවැනි සොරකමක් සිදුවූවා නම් කඳවුර භාර අණදෙන නිලධාරියාට හෝ නාවික හමුදාවේ බලයලත් නිලධාරියෙකුට හෝ පොලිසියට හෝ පැමිණිලි නොකර තම හිතුමතේට කටයුතු කිරීමෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට අපකීර්තියක් වන පරිදි විනය කඩවන ආකාරයට ක්‍රියා කර ඇති බවයි. එකී විනය විරෝධී ක්‍රියාව සම්බන්ධව නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත ස්වාධීන පරීක්ෂණය මණ්ඩලයක් මගින් මෙම සිදුවීමට අදාලව පරීක්ෂණ කටයුතු සිදු කර සියළු පාර්ශ්වයන්ගේ ප්‍රකාශ සටහන් කරගත් පසු පර්යේෂණ මණ්ඩලයේ අදහස පරිදි විනය විරෝධී ක්‍රියාවක් පැමිණිලිකරු සිදු කර තිබීම මත නාවික හමුදා රෙගුලාසි ප්‍රකාරව ස්වෙච්ඡා රෙගුලාසි 23 වගන්තිය සහ 2004.06.07 දිනැති නාහ.එස්. දරණ නාවික හමුදාපතිගේ බලතල ප්‍රකාරව මෙම පැමිණිලිකරු නාවික හමුදවෙන් ඉවත් කිරීමට නිර්දේශ කිරීම මත ක්‍රියා කරන ලද බවයි. ඒ අනුව මූලික පරීක්ෂණ උසාවි නියෝගය මත කටයුතු කර තිබීමෙන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩකිරීමක් සිදු කර නොමැති බවය.

පරීක්ෂණයේදී අනාවරණය කරගත් කරුණු :

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සිතාසි ප්‍රකාරව දෙපාර්ශයන් කැඳවා සිදු කල පරීක්ෂණ වලට අනුව අනාවරණය වී ඇති කරුණු පහත පරිදි වේ. පැමිණිලිකරු තම පැමිණිල්ලෙන් දක්වා ඇති කරුණු හා දිව්රුම් ප්‍රකාශයෙන් දක්වා ඇති කරුණු සමග වැඩිදුරටත් ප්‍රකාශ කරන ලද කරුණු පහත පරිදි වේ.

මූලික පරීක්ෂණ උසාවියක් සිදු කලද එය පදනම් නොවූ මූලික පරීක්ෂණ උසාවියක් නැවත සිදු කිරීම තුලින් අගතියක් තමාට සිදුවූ බවත් ය. වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන්නේ මූලික පරීක්ෂණ උසාවි 02

ඇති නොකල බවය. රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශය විසින් නාවික හමුදාපති විසින් සාධාරණ පරීක්‍ෂණයක් සිදු කල යුතු බව තම අදහස ලෙස දක්වා තිබීමට පෙනී යන වැදගත් කාරණාවක් බවද

2019.06.27 දින පරීක්‍ෂණ අවස්ථාවේ රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් කරුණු දක්වන ලද අනිල් දනන්සූරිය මහතා පෙන්වා දෙන ලද්දේ පැමිණිලිකරුට අසාධාරණයක් සිදුව ඇති බවය. නාවික හමුදාවේ ස්වෙච්ජා විශේෂ ක්‍රමය යටතේ බඳවාගත් පැමිණිලිකරු වසර 17කට ආසන්න කාලයක් සේවය කර ඇති බවද නාවික හමුදාවේ යම් සිදුවීමක් සම්බන්ධව මූලික පරීක්‍ෂණයක් පවත්වා සේවය අවසන් කර තිබීම තුල නෛතික ගැටළුවක් පැන නගින බවය. තමා නාවික හමුදාවේ ස්වවේජා විශේප ක්‍රමය යටතේ බඳවා ගත් පැමිණිලිකරු වසර 17කට ආසන්න කාලයක් සේවය කර ඇති බවද නාවික හමුදාවේ යම් සිදුවීමක් සම්බන්ධව මූලික පරීක්‍ෂණයක් පවත්වා සේවය අවසන් කර තිබීම තුල නෛතික ගැටළුවක් පැන නගින බවය. තමා නාවික හමුදාවේ නීති නිලධාරි ලෙස සිටියදී මෙම තත්ත්වය පැහැදිලි කර දී ඇති බවද දැනට ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් එම අමාත්‍යාංශයේ සේවය කිරීමට අනුව ගොනු අධ්‍යයනය කරමින් සහ පෙර තිබූ තීන්දු ඇසුරින් කරුණු දක්වන බව ද පෙන්වා දෙන ලදි.

පැමිණිලිකරුට එරෙහිව මූලික පරීක්‍ෂණ උසාවියක් මගින් පරීක්‍ෂණ පවත්වා තිබුණද චෝදනා පත්‍රයක් නිකුත් කොට චෝදනාව දැනගැනීමට හා නිදහසට කරුණු කියා පෑමට අවස්ථාවක් ඔහුට ලබාදී නැත. ඉන් මෙම පැමිණිලිකරුට තම නිර්දෝෂීභාවය කියා පෑමට ඇති අවස්ථාව අහිමි කර ඇති බවද තමාට චෝදිත කාරණාව සම්බන්ධව හරස් ප්‍රශ්න ඇසීමට ඇති අවස්ථාව අහිමි කර ඇති බවද පෙන්වා දෙන ලදි. පැමිණිලිකරුට සවන් නොදීමෙන් ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය කර ඇති බවද පෙන්වා දෙන ලදි. නමුත් නාවික හමුදාපති වෙනුවෙන් පෙනී සිටි නිලධාරීන් විසින් කියා සිටින ලද්දේ පෙර ඔවුන් තම කරුණු තුලින් දක්වා සිටි කරුණුම වන අතර මූලික පරීක්‍ෂණ උසාවියක තීරණය අනුව තීරණ ගත් බව ද මූලික අයිතිවාසිකම් කඩවීමක් නොකල බවයි.

පැමිණිලිකරු විසින් නාවිකයකු වන එච්.එම්.ඩී.එම්.හේරත් යන අයගෙන් බලහත්කාරයෙන් මුදල් ගැනීම පිළිබඳ වාර්තා වී තිබුණද පැමිණිලිකරුගේ මුදල් සොරකම් කිරීමක් පිළිබඳ ඔහු පෙර පැමිණිල්ලක් නාවික හමුදාවේ බලයලත් නිලධාරියෙකුට හෝ පොලිසියට හෝ දන්වා නොමැති බවද එම සොරකම පිළිබඳ පැමිණිලිකරු තම අභිමතය පරිදි කරුණු කියා සිටින බවද නාවික හමුදාවේ විනය කඩවන ආකාරයට කටයුතු කර තිබීම මත නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත ස්වාධීන පරීක්‍ෂණ මණ්ඩලයක් විසින් කරුණු විමර්ශනය කර තීරණය ගත් බවද පෙන්වා දෙන ලදි. පරීක්‍ෂණ මණ්ඩලයේ තීරණය පැමිණිලිකරු විනය විරෝධී ලෙස කටයුතු කර ඇති බව ද නාවික හමුදා රෙගුලාසි ප්‍රකාරව ස්වෙච්ජා රෙගුලාසි හි 23 වගන්තිය ද 2004.06.07 දිනැති අංක නාහ 5 දරණ නාවික හමුදාපතිගේ සංදේශයේ 22 වන පරිච්ජේදයේ අනු අංක (ආ) යටතේ නාවික හමුදාපති වෙත පැවරී ඇති බලතල යටතේ පැමිණිලිකරු ඉවත් කිරීමට නිර්දේශ කල බවය.

ආරක්‍ෂක අමාත්‍යාංශය වෙනුවෙන් පැමිණි නීති නිලධාරි විසින් දක්වා සිටියේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 182 වගන්තියෙන් දක්වා ඇති පරිදි චෝදනා පත්‍රයක් ලබා නොදී වරදකරුවකු කිරීම කල නොහැකි බවට වූ නීති සිද්ධාන්තය උල්ලංඝනය වීමෙන් පෙත්සම්කරුට අගතියක් වන බවද නඩු තීන්දු කිහිපයක් ඇසුරින් කරුණු කියා පෑමට සූදානම් බව පෙන්වා දෙන ලදි. අභිමතය භාවිතා කිරීම ද නඩු

තීන්දු ගණනාවකින් විසදා ඇති බවද ජාත්‍යන්තර ප්‍රඥප්තීන් තුළින් පිළිගැනීම් වලට ද එරෙහිව ක්‍රියා කිරීම සම්බන්ධව නාවික හමුදාව ගැටළුවකට මුහුණ දියහැකි බවද පෙන්වා දෙන ලදි.

නාවික හමුදාපතිට එරෙහිව අභියාචනාධිකරණයේ ගොනු කළ නඩුවක් වන අංක 71/16 රිට් නඩුවේදී දක්වා ඇත්තේ නාවික හමුදාපති හට සේවයෙන් පහ කිරීමට අභිමතානුසාරී බලයක් නැති බවද නාවික රෙගුලාසි වල එවැනි බලයක් තිබුණද එම ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය කරන බව අධිකරණය විසින් පෙන්වා දී තිබෙන බව ප්‍රකාශ කරන ලදි. නාවික හමුදාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීතිය. නීතිය ද උල්ලංඝනය කර ඇති බව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13.5 ව්‍යවස්ථාව ප්‍රකාරව වරදකරු යැයි ඔප්පු කරන තෙක් සෑම තැනැත්තෙකුම නිර්දෝෂීය යන්න පූර්වානුමාන කළයුතු වුවද තම නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට පෙත්සම්කරුට තම නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට චෝදනා පත්‍රයක් හෝ ලබාදී නැති බව පෙන්වා දෙන ලදි. අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව චෝදනා පත්‍රයක් නොමැතිව පුද්ගලයෙකු වරදකරු කළ නොහැකි බවද කියා සිටින ලද අතර <u>රොබට් එදිරිව හොක්වුඩ් නඩුවේදී</u> අභිමතය සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කර තිබෙන බවද පෙන්වා දෙන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 182 ව්‍යවස්ථාව අනුවද පෙත්සම්කරුට අගතියක් වී ඇති අතර ගොඩගේ එදිරිව කහවත්ත (1992 SLR 54) හිදී චෝදනා පත්‍රයක් නොමැතිව පුද්ගලයෙකු වරදකරු කළ නොහැකි බව ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් ප්‍රකාශ කරමින් පෙත්සම්කරුට සාධාරණ පරීක්ෂණයක් පවත්වා තීරණයක් ගතයුතු බව පෙන්වා දෙන ලදි.

**නිරීක්ෂණ හා නිගමන :**

පෙත්සම්කරුගේ පෙත්සමට අදාළව දක්වා ඇති කරුණු ද වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම්ද සළකා බැලීමේදී පහත සඳහන් නිරීක්ෂණ අනුව නිගමන වලට එළඹිය හැකි බව පෙන්වා දෙමි.

පෙත්සම්කරු ප්‍රකාශ කරන කරුණු අනුව ඔහුගේ නිවසට පැමිණි එච්.එම්.ඩී.එම්.හේරත් යන නාවිකයා විසින් කළ සොරකමක් සම්බන්ධ ප්‍රශ්නය මුල් කරගනිමින් ගැටළුව පැන නැගී ඇත. මෙය සිදුවූ බව සත්‍යයක් නම් නාවික හමුදාව තුළ සිදුවූ ක්‍රියාවක් නොවන අතර පෙත්සම්කරුට මේ පිළිබඳ පැමිණිලි කළ හැකිව තිබුණේ පොලිස් ස්ථානයට වේ. එහෙත් මෙම ක්‍රියාව නාවිකයින් අතර වූ ගැටළුවක් බැවින් නාවික හමුදාවේ වගකිවයුතු නිලධාරියෙකු හට වාර්තා කිරීමට හෝ අවස්ථාව තිබියදී පැමිණිලිකරු විසින්ම සොරකම් කළ බවට ප්‍රකාශිත හේරත් යන අය සමග එකගතාවයකට පැමිණීම මත ගැටළුව නිරාකරණය කර ගනිමින් සිට ඇත. එහෙත් හේරත් නැමැති ඉහත කී නැවියා පසුව මෙම සොරකම අසත්‍යයක් බවට ප්‍රකාශ කර පැමිණිලිකරුට එරෙහිව නිලධාරීන් වෙත පැමිණිලි කිරීම මත තවදුරටත් සොරකමක් නොව හේරත් යන අයට බලපෑම් කර මුදල් ඉල්ලීමේ ක්‍රියාව සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා සේවයෙන් පහ කිරීම දක්වා ප්‍රශ්නය දීර්ඝ ක්‍රියාවලියකින් අවසන්ව ඇත. පැමිණිලිකරු සේවයෙන් පහ කිරීම අවසන් විසඳුම වී ඇත.

පැමිණිලිකරුගේ මුළු සේවා කාලය සේවයෙන් පහ කරන විට ආසන්න වශයෙන් වසර 17ක් පමණ බව පෙනී යයි. එම සේවා කාලය තුළ වෙනත් විනය විරෝධී ක්‍රියා සිදුවී නැති බවද පෙනී යයි. පැමිණිලිකරුට මෙම ප්‍රශ්නගත මුදල වැනි සුළු මුදලක් බලපෑම් කර ලබාගැනීමට තරම් අවශ්‍යතාවයක් තිබේද යන්න ගැටළුවකි. මෙම අවස්ථාවේ කිවයුතු වන්නේ යම් සිදුවීමක් සිදුව ඇතත් පැමිණිලිකරුට සාධාරණ සවන්දීමක් සිදු කර නොතිබීමෙන් සත්‍ය අනාවරණය කර ගැනීමට ඇති අවස්ථාව ගිලිහී ගොස් ඇති බවය. නාවික හමුදාපති සතු බලතල යටතේ අභිමතානුසාරී බලතල භාවිත කර දීර්ඝ කාලීන සේවයක් ලබාදුන් සේවකයෙකු සේවයෙන් පහ කිරීම මෙම ගැටළුවට ඇති එකම විසඳුම ද යන්න ගැටළුවකි. එසේම නාවික හමුදාපති හට තම අභිමතය අභිමතානුසාරී ලෙස භාවිතා කළ හැක්කේ පවතින වෙනත් නීතීන් හා ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය කරමින් ද යන්න පිළිබඳ ගැටළුවක් මත වේ. පැමිණිලිකරු ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට ද නාවික හමුදාපතිට මෙන්ම සේනාධිනායක වන අතිගරු ජනාධිපති දක්වා ද කළ ඉල්ලීම් නොසළකා හැර ඇති බවද පෙනී යයි. පැමිණිලිකරුට තම නිදහසට කරුණු කියාපෑමට අවස්ථාවක් ලබාදී නැති බවද අනාවරණය වේ. චෝදනා පත්‍රයක් නොමැතිව නිදහසට කරුණු කියා පෑමට අවස්ථාවක් නොදී යම් තැනැත්තෙකු වරදකරුවකු කිරීම පවතින අපරාධ නඩු විධාන සංග්‍රහයේ 182 වගන්තියටද ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් ද උල්ලංඝනය කරන බව ද පෙන්වා දෙමි. 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13.5 ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිත මූලික අයිතිවාසිකමක් වන වරදකරුවකු යැයි ඔප්පු වන තුරු සෑම තැනැත්තෙකුම නිර්දෝෂී බවට වන පූර්වානුමාන කිරීමේ අයිතිය ද උල්ලංඝනය වීමකට පැමිණිලිකරු ලක්ව ඇති බව පෙනී යයි.

නාවික හමුදාපති විසින් නිකුත් කළ සංඥා/සංදේශ මගින් දැනට ක්‍රියාත්මක නීතිමය ක්‍රමවේද උල්ලංඝනය කළ හැකිද යන්න සහ සංදේශ යනු පිළිගතහැකි නීතීන්ද යන්න සොයා බැලිය යුතුය. සංදේශ හෝ සංඥා හෝ මගින්ද වෙනත් නීති හෝ රෙගුලාසි මගින්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගත් නීතීන් උල්ලංඝනය කළ නොහැකි බව පෙන්වා දියයුතුය. නීත්‍යානුකූල භාවයකින් යුතු රෙගුලාසි පැනවීමේ නෛතික බලය නාවික හමුදා පනතේ 161(5) අනුව ආරක්ෂක අමාත්‍යවරයාට හිමි බලතල අතර එකක් වන අතර එසේ පනවනු ලබන රෙගුලාසි වුවද පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත් පසු පමණක් නීති වශයෙන් පිළිගැනේ.

නාවික හමුදාවේ සාමාජිකයෙකුට එරෙහිව චෝදනා ගොනු කර නඩු විභාගයක් පවත්වා දඬුවම් පැමිණවියහැකි ක්‍රමවේද දෙකක් ඇත. එකක් නම් ලඝු නඩු විභාගයයි. දෙවන අවස්ථාව යුධාධිකරණයක් වෙත පැමිණවීමය.

පරීක්ෂණ මණ්ඩලයකින් කරනු ලබන්නේ මූලික තොරතුරු විමර්ශනය කර නිර්දේශයක් ලබාදී චෝදනාවක් එල්ලවේ නම් ඉහත ක්‍රමවේද දෙකෙන් එකක් අනුමගමනය කිරීමය. එය නාවික හමුදාවේ නීතයෙන් නියම කර ඇති ක්‍රමවේදයයි. නමුත් මෙහිදී සිදුව ඇත්තේ මූලික පරීක්ෂණ අවස්ථාවේම තොරතුරු රැස් කර පැමිණිලිකරු සේවයෙන් පහ කර තිබීමය.

චෝදනා පත්‍රයක් රහිතවද පැමිණිලිකරුට සාධාරණ සවන්දීමක් නොකිරීමෙන්ද නාවික හමුදාපති තම අභිමතය අභිමතානුසාරීව භාවිතා කර තිබීමෙන්ද පැමිණිලිකරුට විධායක නිලධාරීන්ගෙන් වූ තර්ජන නොසළකා හැරීමෙන්ද ; පැමිණිලිකරුගේ අභියාචනා නොසළකා හැරීමෙන් ද නාවික හමුදා නීතිය තුළින්ම

පැමිණිලිකරුට අගතියක් සිදුකර ඇති අතර ඉන් නාවික හමුදාවට අපකීර්තියක් හා විනය කඩකිරීමක් සිදුකළ නිලධාරින් කවුරුන්ද යන්න සොයා ගැනීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ.

අභියාචනාධිකරණයේ විභාග වූ අංක: CA/WRIT/171/2016 හිදී විනිසුරු මහින්ද සමයවර්ධන මහතා විසින් ප්‍රකාශ කර ඇති කරුණු තුළින් දක්වා ඇත්තේ පරිපාලන තීරණයන්හිදී ගන්නා ලද නීත්‍යානුකූල නොවන පරිපාලන තීරණ තවත් පුද්ගලයින්ගේ ජීවිතවලට බොහෝ කණගාටුදායක තත්ත්වයන් ඇති කරන බවය. මෙම නඩුවද නාවික හමුදාපතිට එරෙහිව පවරන ලද නඩුවක් වන අතර අනිවාර්ය නිවාඩු යවන ලද නාවිකයකු විසින් ගොනු කරන ලද නඩුවකි. එහිදී දීර්ඝ වශයෙන් පරිපාලන නීතිය උල්ලංඝනය කරමින් ගන්නා ලද තීරණ පිළිබඳ විනිශ්චය කර තිබූ අතර පෙර නඩු තීන්දු ගණනාවක් විග්‍රහ කර කරුණු වාර්තා කරන ලදි. මෙහිදී Lord wrenbury in Robrts Vs Hopwood(1925) AC578 at 613 හි උපුටනයක් මගින් අභිමතය භාවිතා කළයුතු වන්නේ කෙසේද යන්න දක්වා තිබුණේ.

> " A person who is vested with a discretion must exercise his discretion upon reasonable grounds. Discretion does not empower amen to do what he likes merely because he is minded to do so. He must in the exercise of his discretion do not what he likes but what he ought. In other words, he must by the use of reason, ascertain and follow the course which reson directs. He must act reasonably "

එසේම තවදුරටත් ඉන් දක්වා ඇත්තේ Removal From service is a serious punishment. Punishment shell commensurate with the offence committed ලෙස වේ.

අභියාචනාධිකරණයේ විභාග වූ අංක **CIA/WRIT/107/2016** හිදී ද ගුවන් හමුදාවට එරෙහිව විභාග වූ මෙම නඩුවේදී දිගින් දිගටම එහි පැමිණිලිකරු සේවයෙන් පහ කර තිබීම පිළිබඳ සාකච්ඡා කර තිබී ඇත. සේවයෙන් ඉවත් කිරීම නෛතික තත්ත්වයන් වඩාත් හොඳින් දීර්ඝ ලෙස අධ්‍යයනය කර කළයුතු බව එහිදී හොඳින් විස්තර කර දක්වා තිබී ඇත. **<u>රොබට් එදිරිව හොක්වුඩ් නඩුවේ දී</u>** ද දීර්ඝ වශයෙන් අභිමතය භාවිතා කළයුතු ආකාරය දක්වා තිබී ඇත.

**<u>ගොඩගේ එදිරිව කහවත්ත (1992 SLR 54)හි දී</u>** චෝදනා පත්‍රයක් නොමැතිව පුද්ගලයකු වරදකරු කළ නොහැකි බවද නීතිය ඉදිරියේ පිළිගෙන තිබේ. මෙම අවස්ථාවේ පෙත්සම්කරුට මෙකී සියළුම නීතිමය තත්ත්වයන් අහිමිව ඇති අතර පෙත්සම්කරුට නාවික හමුදා නීතිය යටතේ ලසු නඩු විභාගයක් හෝ යුධාධිකරණයකට යොමු කිරීමකින් තොරව මූලික පරීක්ෂණයකින් අනතුරුව චෝදනා පත්‍රයක් නිකුත් නොකොට ඔහුට සවන්දීමකින් තොරව සේවය අවසන් කර තිබීමෙන් නාවික හමුදාපති අභිමතය ප්‍රකාරව ගන්නා ලද තීරණය තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද උලල්ංඝනය වීමට ලක්ව ඇති අතර එය 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය වීමටද පැමිණිලිකරු ලක්ව ඇති අයෙකු බව මින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :

වගඋත්තරකරුවන් විසින් පහත සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

1. පෙත්සම්කරුට සාධාරණ සවන්දීමක් සිදු කිරීමේ අවස්ථාව අහිමිව ඇති බැවින් නැවත ඔහුට කරුණු දැක්වීමට ප්‍රමාණවත් තරම් අවස්ථාව ලබාදෙමින් පරීක්ෂණයක් සිදු කිරීමට පියවර ගතයුතු බවද

2 එකී පරීක්ෂණයේ ප්‍රතිඵලට අනුව හෝ එවැනි පරීක්ෂණයක් සිදු කරන්නේ නොමැති නම් පෙත්සම්කරුට සියළු හිග වැටුප් වරප්‍රසාද සහිතව සේවය අවසන් කළ දින දක්වා තවදුරටත් ඔහුට සේවය කළ හැකිව තිබූ කාලය ගණනය කර ලබාදීමට හෝ පිහිටුවීමට නාවික හමුදාපති විසින් කටයුතු කළයුතු බවට ද

3. පෙත්සම්කරු විශ්‍රාම ගැනීමට නිල වශයෙන් හිමි වයස සම්පූර්ණ වන දිනයට අනුව විශ්‍රාම ගැන්වීමට ක්‍රියා කළයුතු බවට ද වගඋත්තරකාර පාර්ශවය වෙත නිර්දේශ කෙරේ.

2021.12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දීමට කටයුතු කළයුතු අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසුයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ.නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ද/ Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Commissioner
Human Rights Commission of Sri Lanka